**පස්සර ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
---------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**
-----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
---------------------------------

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 දිනද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 24 දිනද විගණනයට ඉදිරිපත් කරන ලදී. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජූලි 31 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට පස්සර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
-----------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**
-----------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට ණයහිමි වටිනාකම රු.50,781 ක් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.
(ආ) 2016 වර්ෂයේදී රු.101,440 ක පොදු තැන්පත් මුදලක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.
(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.71,981 ක ඉදිරි ගෙවුම් ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**
------------------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.30,210,573 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.24,104,038 ක් විය.

1.3.3 **විගණනය සඳහා සාක්ෂි නොවීම**
-----------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා රු. 97,118,363 ක් වටිනා ගිණුම් විෂයයන් 06 ක් සඳහා විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය / සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.4 **නීති, රීති, හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**
---------------------------------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසි විධි විධානවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය | ලියාපදිංචි ත්‍රිරෝද රථ 310 කින් අතුරු ව්‍යවස්ථා පනවා ගාස්තු අයකර නොතිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා ( මූල්‍ය හා පරිපාලන) රීති 217 හා 218 | 2016 වර්ෂය සඳහා ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණයක් කර නොතිබුණි. |
| (ඇ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | |
| | i. මු.රෙ.110 | හානි හා පාඩු සම්බන්ධව ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි. |
| | ii. මු.රෙ. 189 | 1994 සහ 1996 වර්ෂවලදී ආදායම් වශයෙන් සභාවට ලැබී අගරුවූ රු.75,712 ක් වටිනා චෙක්පත් 03 ක් වෙනුවෙන් ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | iii. මු.රෙ. 371 | 2004 සහ 2006 වර්ෂවලදී දෙන ලද අත්තිකාරම් රු.64,996 ක් පියවා ගෙන නොතිබුණි. |
| | iv. මු.රෙ. 396(ඇ) | නිකුත් කළ නමුත්, ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ මාස 06 ඉක්මවූ රු.21,962 ක් වටිනා චෙක්පත් 03 ක් ආදායමට ගෙන නොතිබුණි. |
| | v. මු.රෙ. 570 | තැන්පත් ලේඛනය යාවත්කාලීනව නඩත්තු කර නොතිබුණි. |
| (ඈ) | ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 1.6 හා 4 වගන්තිය | ස්ථාන මාරුවීම් ලැබූ, සේවය හැර ගිය සේවකයින් දෙදෙනෙකුගෙන් අයවිය යුතු සේවක ණය රු.6,835 ක් අයකරගෙන නොතිබුණි. |
| (ඉ) | 1980 අංක 47 දරන පාරිසරික පනත හා අංක 1159/22 දරන ගැසට් පත්‍රය | 2016 වර්ෂයේ දී ව්‍යාපාර ආයතන 27 ක් සම්බන්ධව පාරිසරික බලපත්‍ර නිකුත් කර නොතිබුණි. |
| (ඊ) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | 2012 වර්ෂයේදී අයකර ගන්නා ලද එකතු කළ අගය මත බදු රු.13,821 ක් දේශීය ආදායම් දෙපාර්ත-මේන්තුව වෙත ප්‍රේෂණයකර නොතිබුණි. |

2. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

-------------------------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵලය**

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 8,444,560 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 11, 803,722 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

----------------------

2.2.1 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

---------------------------------------

(අ) 2016 ජනවාරි 01 දිනට පැවැති මුළු හිඟයෙන් වර්ෂය තුළ අයකර ගැනීම් ප්‍රගතිය සියයට 61 ක් වූ අතර, 2016 දෙසැම්බර් 31 දිනට අයකර ගතයුතු හිඟය රු.2,077,632 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයට බිල්කිරීම් වලින් වර්ෂය තුල අයකර ගැනීම් ප්‍රතිශතය සියයට 69 ක් වූ අතර, 2016 දෙසැම්බර් 31 දිනට අයකර ගතයුතු හිඟය රු.1,077,120 ක් විය.

(ඇ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රචාරක දැන්වීම් පුවරු වලින් අතුරු ව්‍යවස්ථා පනවා ආදායම් අයකර ගෙන නොතිබුණි.

2.2.2 **වරිපනම් හා බදු**

------------------

දේපල ඒකක 1,671 ක් සඳහා 2005 වර්ෂයේ තක්සේරුව මත 2016 වර්ෂයට බදු අයකර තිබුණි.

2.2.3 **උසාවි දඩ**

------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තු ප්‍රමාණය රු. 33,934,965 ක් විය.

2.4 **අධිභාර ගෙවීම**

----------------

**සේවක අර්ථසාධක අරමුදලට අධිභාර ගෙවීම**

---------------------------------------------------

1985 අංක 01 දරන පනතින් සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 16 වන වගන්තිය ප්‍රකාරව, 2002 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා සේවක අර්ථසාධක අරමුදල වෙත රු.12,933 ක අධිභාරයක් ගෙවා තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

3.1 **සන අපද්‍රව්‍ය කළමනාකරණය**

----------------------------------

2015 වර්ෂයේදී රු.5,411,310 ක වියදමක් දරා පස්සර මීදුම්පිටියෙහි ඉදිකරන ලද කසළ ප්‍රතිචක්‍රීකරණය ගොඩනැගිල්ල භාවිතයට ගෙන නොතිබුණි.

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

------------------------------------

හිටපු සභාපතිවරයා සහ උප සභාපතිවරයා පාවිච්චි කල රු.36,908 ක් වන ජංගම දූරකථන දෙක සභාවේ නිල කාලය අවසන් වීමෙන් පසු ආපසු ලබාගෙන නොතිබුණි.

3.3 **නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්**

-------------------------------------

2016 වර්ෂයේ බැංකු ජංගම ගිණුම් 03 ක රු.3,174,421 ක මුදල් ශේෂය වසර 06 ක කාලයක් නිශ්කාර්යව පැවතුනි.

4. **යහපාලනය හා ගිණුම් කටයුතු භාවය**

-----------------------------------------

4.1 **අයවැය පාලනය**

------------------

සමාලෝචිත වර්ෂයේදී අයවැය ලේඛනය ආදායම් හා වියදම් පාලනයේදී පාලන උපකරණයක් ලෙස භාවිතා කර නොතිබුණි.

4.2 **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

--------------------------------

ප්‍රවර්තන වර්ෂයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් ක්‍රියාත්මක කර නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම්

(ආ) ගිණුම්කරණය

(ඇ) ණයගැතියෝ හා ණයහිමියෝ